00228

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව 2022/23 සිවුවන මට්ටම

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය - II LLU 4708

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1

| | |
|---|---|
| දිනය: 25-09-2023 | වේලාව: 11.30-12.30 |

කාලය - පැය 1 යි.

ප්‍රශ්න සංඛ්‍යාව - 02

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

(1) 'සියලු මූලික අයිතිවාසිකම් මානව හිමිකම් වන නමුත්, සියලු මානව හිමිකම් මූලික අයිතිවාසිකම් නොවේ'.

මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? නිදහසින් පසු කාල පරිච්ඡේදය තුල ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය රාමුව තුල මානව හිමිකම් ආරක්ෂා කිරීමට කටයුතු කොට තිබෙන්නේ කෙසේද යන්න කෙරෙහි අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

(2) (අ) බනානා සමූහාණ්ඩුව යනු එක්ස් නම් ආගමික කණ්ඩායමට අයත් බහුතර ජනතාවක් ජීවත් වන රටකි. එම ආගමික සංස්ථාවට අයත් පූජක පක්ෂයේ ඇතැම් අයගේ චර්යාව ආගමික ඇගයුම්වලට පටහැණි බවට පැමිණිලි ලැබී තිබෙන නිසා, පූජක පක්ෂයේ චර්යාවන් නියාමනය කල යුතු බවට ආණ්ඩුව තීරණය කරයි. මේ අනුව, පූජක පක්ෂයේ විනය නියාමනය කිරීම සඳහා බලය ලත් අධිකාරියක් පිහිටුවීමට යෝජනා කෙරෙන පනත් කෙටුම්පතක් ආණ්ඩුව ඉදිරිපත් කොට ඇත. මෙම පනත් කෙටුම්පතේ පහත වගන්තිය ඇතුලත් වේ:

*2 (1) වගන්තිය - 'පූජ්‍ය පක්ෂයට තහනම් කටයුතු කවරේදැයි සඳහන් රෙගුලාසි බලයලත් අධිකාරිය විසින් සම්මත කල යුතුය. මෙම රෙගුලාසිවලට පටහැණිව කටයුතු කරන කවර හෝ අයෙක් වේ නම්, බලය ලත් අධිකාරිය විසින් කරනු ලබන විභාගයකට පසුව, වරදකරු ලෙස ඔප්පු වේ නම්, පූජක සංස්ථාවෙන් නෙරපිය ලැබිය යුතුය'.*

එක්ස් ආගමික කණ්ඩායමේ ප්‍රධාන පූජකවරයා මෙම පනත් කෙටුම්පත තම ප්‍රජාවේ මූලික අයිතිවාසිකම් කඩ කිරීමකට හේතු වේ යැයි සලකයි. ඔහුට යම් සහනයක් ලබාගත හැකිදැ'යි උපදෙස් දෙන්න. (ලකුණු 10)

(ආ) බනානා සමූහාණ්ඩුවේ ආගමික කටයුතු ඇමතිවරයා 'බලහත්කාරය, වංචාව හා ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබාදීම' යනාදී මාර්ගවලින් පුද්ගලයන් වෙනත් ආගම්වලට හැරවීම තහනම් කරන නව නීතියක් හදුන්වා දීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කලේය. 'ද්‍රව්‍යමය ප්‍රතිලාභ' යන්න කැබිනට් පත්‍රිකාව පහත පරිදි නිර්වචනය කරයි : '...කෑම බීම, නිවාස, රැකියා, ඖෂධ හා ජීවිතයේ මූලික අවශ්‍යතාවලට අදාල වෙනත් ප්‍රතිලාභයක්'.

තම ආගමික කටයුතුවල කොටසක් ලෙස සමාජ සුබසාධන ක්‍රියාවන්හි යෙදෙන සුළුතර ආගමික කණ්ඩායමක් වන වයි හි සාමාජිකයන් මෙම පත්‍රිකාව අනවශ්‍ය ලෙස තම ආගමික නිදහස සීමා කිරීමට හේතු වේ යැයි සිතයි. ආණ්ඩුව මේ සම්බන්ධව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කලහොත් එය අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්කල හැකි ද යන්න සම්බන්ධව ප්‍රජා නායකයන් ඔබගේ උපදෙස් පතයි.

වයි ප්‍රජාවේ නායකයන්ට උපදෙස් දෙන්න.

**ඉහත කී අවස්ථා දෙකෙහිදීම, බනානා සමූහාණ්ඩුවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව 1978 ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සර්වසමාන බව උපකල්පනය කරන්න. අදාල නෛතික අධිකාරීන් වෙත සැඳහුම් කරමින් ඔබගේ පිලිතුර සනාථ කල යුතුය.**

(ලකුණු 10)

(මුලු ලකුණු 20)

***